**ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගම - 2022**

**-------------------------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගමේ (“සමාගම”) 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ අලාභ ප්‍රකාශනය, වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ විගණන විෂය පථය යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරිමේ වගකීම, **පාලනය කරන පාර්ශවයන්** විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවන පරිදි සමාගමේ ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා

ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සමාගම සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.5.1 ලැබිය යුතු දෑ

| විගණණ නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 වර්ෂයේදී ශ්‍රී ලංකා ගුවන් සේවා ව්‍යාපෘතිය ප්‍රතිස්ථාපනය කිරීම සඳහා ප්‍රධාන කළමනාකරු ලෙස සමාගම පත් කිරීමට අදාළව මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු මුළු ලැබිය යුතු ශේෂය වන රු. 246,939,587 න් සියයට 36කට සමාන වන රු. 88,939,587 ක් 2016 වසරේ සිට ශේෂව පවතී. | ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගම මේ වන විට ඉල්ලීම් ගණනාවක් සිදු කර ඇත. නවතම ඉල්ලීම 2022.12.15 දින යවන ලදී. ශ්‍රී ලංකාව මුහුණ දෙන අර්බුදයත් සමඟ අරමුදල් ලැබීම තවත් ප්‍රමාද වනු ඇත. එම නිසා, අපහරණය ගණනය කිරීම සඳහා ද ශේෂය උපයෝගි කර ගන්නා ලද අතර ඒ වෙනුවට බැඳුම්කරයක් නිකුත් කරන ලෙස ඉල්ලා සිටින ලදී. | තවදුරටත් ප්‍රමාදයකින් තොරව නියමිත මුදල අයකර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතු බව සමාගමට නිර්දේශ කෙරේ. |

## 1.6 සම්බන්ධිත පාර්ශව සහ සම්බන්ධිත පාර්ශව ගනුදෙනු හෙළිදරව් කර නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| LKAS 24 හි 13 - 19 ඡේදය සම්බන්ධිත පාර්ශව හෙළිදරව්කිරීම්වලට අනුව, සමාගමේ ප්‍රධාන කළමනාකාරීත්වයේ පිරිස් හා ජාතික ඉතිරිකිරීමේ බැංකුවට අදාළ ගනුදෙනු සහ සීමාසහිත ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුවේ සමගාමී පරිපාලිත ආයතනයක ගනුදෙනු ආදි සම්බන්ධිත පාර්ශ්ව හෙළිදරව් කිරීම් සියල්ල හෙළිදරව් කිරීමට සමාගම අපොහොසත් විය. සමාගමේ සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු හඳුනා ගැනීමට නිසි යාන්ත්‍රණයක් නොතිබුණු බව නිරීක්ෂණය විය. | ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගම විසින් අවසාන ගිණුම්වල අංක 36 දරන සටහනේ සියලුම සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු හෙළිදරව් කර ඇත. | ප්‍රමිතියේ අවශ්‍යතාවයට අනුව, සමාගම විසින් සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සියල්ල හෙළි කළ යුතුය. |

## 1.7 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| අ. | 2021 අංක 01 දරන චක්‍රලේඛයේ 17(ඇ) වගන්තිය - වෙළඳපල මෙහෙයුම් පිළිබඳ ඒකාබද්ධ මෙහෙයුම් උපදෙස් | ස්ථාවර ණය පහසුකම් (SLF) සම්බන්ධ ගනුදෙනු අගරු කිරීම සහ එම ගනුදෙනු පියවීමට අපොහොසත් වීම හේතුවෙන් සමාගමට රු.22,272,152 ක දණ්ඩන මුදලක් ශ්‍රී ලංකා මහ බැංකුවට ගෙවීමට සිදු විය. | සමාගම දණ්ඩන වශයෙන් රු.16,127,826 ක් ගෙවිය යුතුය. මහ බැංකුවේ ප්‍රතිපත්ති පොළී අනුපාත ඉහළ යාමත් සමඟ, 2022 අප්‍රේල් මාසයේ සිට වෙළෙඳපොළේ පොළී අනුපාත ඉහළ යාම තුළින් සමාගම සතුව තිබූ සුරැකුම්පත්වල වටිනාකම් අඩුවීම හේතුවෙන් රඳවා ගත හැකි නිඡ්ක්ෂණදහස් සුරැකුම්පත්වල වටිනාකම අඩු විය. අනෙක් අතට, කාලසීමාව මුළුල්ලේ වෙළඳපොළ ද්‍රවශීලතාවය සෘණ අගයක් වශයෙන් වාර්තා විය. එම නිසා, මහ බැංකුවෙන් ණය ගැණුම් ඒක්ෂණ පදනමින් සපුරා ගැනීමට සමාගමට සිදු විය. සුරැකුම්පත් වඩා හොඳින් භාවිතා කිරීම සහ ණය නිරවුල් කිරීමේ කාලයට අනුකූලව කටයුතු කිරීම සඳහා දැනටමත් සමාගමේ පරිපාලන කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වෙත උපදෙස් ලබා දී ඇත. අන්තර් බැංකු ඒක්ෂණ ණය පහසුකම් (ILF) ඵලදායී ලෙස භාවිතා කිරීම සඳහා මධ්‍යම කාර්යාලය හරහා අධීක්ෂණ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කර ඇති අතර නියමිත වේලාවට සුදුසු ක්‍රියාමාර්ග ගනු ලැබේ. | සමාගම විසින් ශ්‍රී ලංකා මහ බැංකුව මගින් නියම කර ඇති උපදෙස්වලට අනුකූලව කටයුතු කළ යුතු අතර සමාගමේ මෙහෙයුම් කටයුතු වඩාත් වගකීම් සහගතව ඉටු කළ යුතුය. |
| ආ. | ලංකා සෙට්ල් පද්ධති රීති 2.2 සංස්කරණයේ 03 වෙළුමේ 11.2 වගන්තිය | භාරකාර සුරැකුම්පත් සහ පාරිභෝගික ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් සඳහා වෙන් කළ සුරැකුම්පත් භාවිතා කරමින් **එක් දිනක් ඇතුළත** ලබා දෙන ණය පහසුකම අන්තර් බැංකු ඒක්ෂණ ණය පහසුකම් (ILF) ලබා ගැනීම හේතුවෙන් සමාගමට ශ්‍රී ලංකා මහ බැංකුවට දණ්ඩන වශයෙන් රු. 243,830,060 ක් ගෙවීමට සිදු විය. | අයිතම අංක 1.7.අ හි දක්වා ඇති අදහස් දැක්වීමට සමාන අදහස් දැක්වීම | සමාගම ශ්‍රී ලංකා මහ බැංකුව මගින් නියම කර ඇති උපදෙස්වලට අනුකූලව කටයුතු කළ යුතු අතර සමාගමේ මෙහෙයුම් කටයුතු වඩාත් වගකීම් සහගතව ඉටු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| ඇ. | 2021 ජූලි 09 දිනැති 2021 අංක 01 දරන ශ්‍රී ලංකා මහ බැංකු විධානය | සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා කිහිපයකදී 2022 දෙසැම්බර් 31 දක්වා අවම ප්‍රාග්ධන අවශ්‍යතාව වූ රු.මිලියන 2 පවත්වා ගැනීමට සමාගම අපොහොසත් වී තිබුණි. | ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගම තවදුරටත් පාඩු සිදු වීම වළක්වා ගැනීම සඳහා වෙළඳපොළ පොළී අනුපාතිකයේ වැඩිවීමක් අපේක්ෂාවෙන් පාඩු සහිතව සිය කළඹ අඩු කිරීමට පියවර ගෙන තිබුණි. කෙසේ වුවද, අප්‍රේල් මාසයේ දී ප්‍රතිපත්ති පොළී අනුපාත විශාල ලෙස ඉහළ යාමත්, ඊට සමාන්තරව වෙළෙඳපොළ අනුපාත ඉහළ යාමත් සමඟ තවදුරටත් පාඩු ලැබීමෙන් වැළකීම සඳහා සමාගමට තම කළඹ පාඩුවක් දරමින් විකිණීමට සිදු වූ අතර, කළඹේ සාධාරණ වටිනාකම අඩුවීම හේතුවෙන් වෙළෙඳපොළ අලාභ ද සිදු විය. එබැවින්, උපලබ්ධි වූ සහ උපලබ්ධි නොවූ පාඩු දෙකම කලින් වෙන් කර ඇති අතර, රඳවාගත් ඉපැයීම්වල පිරිහීමක් සිදු විය. තවද, පෙර වසරේ ලාභය (2020) මත අධිභාර බද්ද අය කිරීමට රජය ගත් තීරණයට අනුව, සමාගමට රු.මිලියන 260.8 ක් මුදල් බද්දක් ලෙස (එය ගෙවීම සඳහා අදාළ මව් බැංකුව ද වගකිව යුතු වේ) ගෙවීමට සිදු විය. මෙම බලපෑම සමාගමේ රඳවා ගත් ඉපැයීම් සඳහා අය කරන ලදී.<br>කෙසේ වුවද, NSB හි ප්‍රාග්ධනය ඇතුළට ගැලීම සහ 2022 දෙසැම්බර් මාසය සඳහා වාර්තා කළ ශුද්ධ ලාභය ද සමඟ සමාගමේ පවත්නා ප්‍රාග්ධනය 2022.12.31 දිනට රු. මිලියන 2,946 ක් විය. | ශ්‍රී ලංකා මහ බැංකුව මගින් නියම කර ඇති විධානවල දක්වා ඇති අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය පවත්වා ගැනීමට සෑම උත්සාහයක්ම ගත යුතු බව නිර්දේශ කෙරේ. |
| ඇ. | ලියාපදිංචි කොටස් හා සුරැකුම්පත් ආඥාපනත සහ දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත යන මාතෘකාව යටතේ 2019 | සෘජු තැරැව්කාර සහභාගීවන්නෙක් (DDP) විසින් අදාළ දිනයේ ලංකා සෙට්ල් සිස්ටම් වසා දැමීමට පෙර, සුදුසු සුරැකුම්පත්වල මුළු වෙළෙඳපොළ වටිනාකම මගින් එකී ප්‍රතිමිලදී ගැණුම් / ප්‍රතිවර්තන ප්‍රතිමිලදී ගැණුම් ගනුදෙනුවේ කල්පිරීමේ වටිනාකම | මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ 2022 අප්‍රේල් මාසයේ දී සිදු වූ අනුපාතවල හදිසි ඉහළ යාමයි. හිඟය කළමනාකරණය කිරීම සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගම විසින් ප්‍රමාණවත් සුරැකුම්පත් ප්‍රමාණයක් පවත්වා ගැනිම සඳහා NSB වෙතින් පිරිසිදු මිලදී ගැනීමක් ඇත. පවතින සුරැකුම්පත් කළමනාකරණය කිරීම | සමාගම අදාළ පනත්වල දක්වා ඇති විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| දෙසැම්බර් 20 දිනැති 2019 අංක 01 දරන විධානවල 4.7 සහ 4.8 වගන්ති | ප්‍රමාණවත් පරිදි ආවරණය කරනු ලබන බව සහතික කිරීමට අවශ්‍ය ප්‍රමාණයට එම ගනුදෙනුව සඳහා සුදුසු අමතර සුරැකුම්පත් වෙන් කිරීම/ ලබා ගැනීම හෝ ගනුදෙනුවේ කොටසක් මුදලින් පියවීම / ගනුදෙනුවේ කොටසක් පියවීම් සඳහා මුදල් ලබා ගැනීම කළ යුතුය. කෙසේ වුවද, සමාගම අවස්ථා කිහිපයකදී එම අවශ්‍යතාවයට අනුකූල වීමට අපොහොසත් වී තිබුණි. | සඳහා සම්පූර්ණ ණය ගැනීම් ඒක්ෂණ සහ කාලීන ප්‍රතිමිලදීගැනීම් ගිවිසුම්) අඩු කර ඇත. ණය ගැනීමේ තත්ත්ව සංවේදීතා විශ්ලේෂණය මාසිකව සිදු කරනු ලබන අතර ඕනෑම අහිතකර බලපෑමක් කළමනාකරණය කිරීම සඳහා වාණිජ බැංකුවක් සමඟ උපස්ථ අරමුදල් සැපයීමේ වැඩපිළිවෙළක් සම්බන්ධයෙන් සාකච්ඡා පවත්වමින් සිටියි. | |

**1.8 තොරතුරු තාක්ෂණ පොදු පාලන**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගමේ භාණ්ඩාගාර පද්ධතිය NSB සේවාදායකයට සම්බන්ධ කර නොමැති බැවින්, සමාගම එහි උපස්ථ ක්‍රියාපටිපාටිය අතින් සිදු කළ යුතුය. මේ අනුව, දත්ත නිරවද්‍යතාවයේ ඉහළ අවදානමක් ඇති කරමින් මානව දෝෂ සහ ප්‍රතිසාධන ගැටලු ඇතිවීමේ ඉහළ සම්භාවිතාවක් තිබිය හැකිය. | පවතින පද්ධතිය වෙබ් පාදක පද්ධතියක් නොවේ; එබැවින් උපස්ථ ක්‍රියාපටිපාටිය අනුගමනය කරනු ලැබේ. නව ක්‍රමයට යන තුරු විකල්පයක් නොමැත. | දත්තවල නිරවද්‍යතාවය සහ ලබා ගත හැකි බව සහතික කිරීම සඳහා සමාගමේ උපස්ථ ක්‍රියාපටිපාටිය ස්වයංක්‍රීය කළ යුතු බව නිර්දේශ කෙරේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ ශුද්ධ අලාභය රු. 2,025,825,745 ක් වූ අතර ඉකුත් වර්ෂයේ එයට අනුරූප ලාභය රු.6,049,077 ක් විය. එබැවින්, මූල්‍ය ප්‍රතිඵලයේ රු. 2,031,874,822 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ණය ගැනීමේ පිරිවැය ඉහළ යාම, මහ බැංකුවේ විධාන උල්ලංඝනය කිරීම වෙනුවෙන් ගෙවන ලද දණ්ඩන මුදල්, වෙළෙඳපොළ පොළී අනුපාත ඉහළ යාම සහ අඩු ප්‍රතිලාභ සහිත බැඳුම්කර පාඩු දරමින් විකිණීම මෙම පිරිහීමට හේතු ලෙස දැක්විය හැකිය. මේ හේතුවෙන් සිදු වූ ශුද්ධ වෙළෙඳ පාඩුව රු. 2,518,396,414 ක් විය.

## 2.2 ප්‍රධාන ආදායම් සහ වියදම් අයිතමවල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් සහ වියදම් අයිතමයන් ඉකුත් වර්ෂය හා සැසඳීමේ දී වැඩිවීමේ හෝ අඩුවීමේ ප්‍රතිශතය පිළිබඳ විශ්ලේෂණය පහත දක්වා ඇති පරිදි වේ;

| විස්තර | විචලනය - හිතකර/ (අහිතකර) (රු.) | විචලනය (%) | විචලනය සඳහා හේතු |
|---|---|---|---|
| පොළී ආදායම | 899,007,129 | 62 | පොළී අනුපාත වැඩි කරන ලදී. |
| ශුද්ධ පොළී ආදායම | (554,062,944) | (91) | ණය ගැනීමේ පිරිවැය වැඩි වීම සහ මව් සමාගමින් අනිශ්චිත ණය ලබා ගැනීම. |
| ගාස්තු සහ කොමිස් ආදායම | (29,259,223) | (59) | NSB භාරකරු ගාස්තුව අත්හිටුවීම සහ ඇතැම් භාරකාර ගිවිසුම් අවසන් කිරීම. |
| ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමට මූල්‍ය උපකරණවලින් ලද ශුද්ධ වෙළඳ ලාභය/ (පාඩුව). | (1,903,010,935) | (309) | තවදුරටත් පාඩු අවම කර ගැනීම සඳහා වෙළෙඳපොළ පොළී අනුපාත වැඩි කිරීම සහ අඩු ප්‍රතිලාභ සහිත බැඳුම්කර පාඩු දරමින් විකිණීම. |
| පුද්ගල පිරිවැය | 6,824,667 | 17 | ස්ථිර කාර්ය මණ්ඩලයේ වැටුප් සංශෝධනය කිරීම. |
| වෙනත් වියදම් | 267,621,403 | 984 | විනිමය අනුපාත වැඩිවීම නිසා Bloomberg ගාස්තු සහ SWIFT ගාස්තු වැඩි විය.<br>ශ්‍රී ලංකා මහ බැංකුවේ විධාන උල්ලංඝනය කිරීම් වෙනුවෙන් රු. 259,957,886 ක දණ්ඩන ගාස්තු ගෙවීම. |

## 2.3 අනුපාත විශ්ලේෂණය

අංශයේ අනුපාත හා සැසඳීමේ දී, සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ වැදගත් ගිණුම්කරණ අනුපාත කිහිපයක් සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

| විස්තරය | අංශය | | සමාගම | |
|---|---|---|---|---|
| | 2022 | 2021 | 2022 | 2021 |
| හිමිකම් මත ප්‍රතිලාභ (%) | 11.4 | (2.5) | (54.5) | 0.17 |
| වත්කම් මත ප්‍රතිලාභ (%) | 3 | (0.7) | (18.6) | (0.13) |
| අවදානම් මත බර තබන ලද ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය – (අවම අවශ්‍යතාවය - 10%) | 23.2 | 42.8 | 36.7 | 22.36 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනික පාලන ව්‍යුහය ශක්තිමත් කිරීම සහ සමාගමේ මෙහෙයුම්, ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි වැඩිදියුණු කිරීම සඳහා බැංකුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේ විශේෂඥ දැනුම ලබා ගැනීම සඳහා කළමනාකරණ කමිටුවක් පිහිටුවා ඇති අතර එය අධීක්ෂණ ධාරිතාවක් සහිතව ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. කෙසේ වුවද, 2022 වසර සඳහා කිසිදු කළමනාකරණ කමිටු රැස්වීමක් පවත්වා නොතිබුණි. | ALCO රැස්වීම් මගින් එහි අරමුණු ඉටු වන බැවින් කළමනාකරණ කමිටුව විසුරුවා හැරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත. | සමාගමේ සුමට ක්‍රියාකාරිත්වය සහතික කරනු ලැබිය හැකි ආකාරයට අදාළ වන අවස්ථාවලදී, සමාගම විසින් අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා අනු කමිටු ස්ථාපනය කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| අ. | සියලුම ගනුදෙනු ටිකට්පත් අනුක්‍රමික අංක අනුපිළිවෙලකට අංකනය කර තිබිය යුතු අතර අනුමත මෙහෙයුම් අත්පොතට අනුව අදාළ නිලධාරීන් විසින් අනුමත කර තිබිය යුතු වුවද, සමාගමට එසේ අනුකූලව කටයුතු කිරීමට නොහැකි වූ අවස්ථා තිබුණි. | සියලුම ගනුදෙනු ටිකට්පත් අනුක්‍රමික අංක අනුපිළිවෙළකට තහවුරු කිරීමේ විසඳුමට ඇතුළත් කර ඇති අතර මධ්‍යම කාර්යාලයේ සහ පරිපාලන කාර්යාලයේ අදාළ නිලධාරීන් මෙහෙයුම් අත්පොතට අනුව, ගනුදෙනු අනුමත කරනු ලැබේ. ගනුදෙනු තහවුරු කිරීම සඳහා අදාළ VTR සමඟ MIS අරමුණු සඳහා අතින් ගනුදෙනු ප්‍රවේශපත් ජනනය වේ. ඒ අනුව, කරුණාකර පහත කරුණු සටහන් කර ගන්නා ලෙස ඉල්ලා සිටිමි.<br>i. අයදුම්පත මත පදනම්ව පාරිභෝගික ගනුදෙනු උත්පාදනය කරනු ලබන අතර ගනුදෙනු ටිකට්පත් උත්පාදනය කරනු ලබන්නේ ලාභ ගණනය කිරීමේ අරමුණ සඳහා පමණි. එබැවින් අනුමත කිරීම අවශ්‍ය නොවේ. (උදා. CusInv2022080043/44/45)<br>ii. ගනුදෙනු ටිකට්පත් අනුමත කිරීමට ප්‍රධාන අලෙවි නියෝජිතයා වෙත බලය පවරා ඇත.<br>iii. ඇතැම් අවස්ථාවලදී, අනුමත කිරීමේ බලධාරියා නිවාඩු ලබා ඇති අවස්ථා තිබුණි. | සමාගම මෙහෙයුම් අත්පොතෙහි විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | කෙසේ වුවද, අපි වෙනස සටහන් කළ අතර අනාගත අවස්ථාවලදී මෙය වළක්වා ගැනීමට අවශ්‍ය පූර්වාරක්ෂක ක්‍රියාමාර්ග ගන්නෙමු. එයට අමතරව, නව පද්ධති අත්පොත ක්‍රියාත්මක කිරීමත් සමඟ ගනුදෙනු ටිකට්පත් උත්පාදන කොටස මෙම ක්‍රියාවලියෙන් බැහැර කළ හැකි වනු ඇත. | |
| ආ. | අනුකූල නොවීම සහ ගනුදෙනුවලට අදාළව ඇති වන අවදානම් වළක්වා ගැනීම සඳහා නිත්‍ය පිළිවෙතකට සිදු වන රජයේ සුරැකුම්පත් ගනුදෙනු සත්‍යාපනය කිරීම සඳහා සමාගම විසින් දෛනික විගණන නිලධාරියකු පත් කර නොතිබුණි. | සමාගමේ මධ්‍යම කාර්යාලය රජයේ සුරැකුම්පත් සම්බන්ධ ගනුදෙනු වැඩි සංඛ්‍යාවක් දෛනික පදනමින් නිරීක්ෂණය කරයි. අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව, බැංකුවේ නිලධාරියකු ද්විතීයන පදනම මත පත් කිරීමට අපි පියවර ගන්නෙමු. | සම්බන්ධිත අවදානම් අවම කිරීම සඳහා සමාගම විසින් දෛනික විගණන නිලධාරියෙකු පත් කළ යුතුය. |
| ඇ. | භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම සඳහා NSB ප්‍රධාන කාර්යාල ශාඛාවේ 2022 අප්‍රේල් 29 වැනි දින මුදල් තැන්පත් කර ඇති ගනුදෙනුකරුවෙකුට අදාළ රු. 5,500,000 ක අරමුදල් රැස් කිරීමට සමාගම විසින් කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමට අපොහොසත් වී ඇත. ගනුදෙනුව සිදු වූ දින සිට මාස 10කට පසුව, සමාගමෙන් ලැබුණු උපදෙස් මත NSB ශාඛාව මගින් 2023 මාර්තු 07 දින මෙම මුදල ප්‍රේෂණය කර ඇත. සමාගමේ අරමුදල් කළමනාකරණය සම්බන්ධයෙන් නිසි අභ්‍යන්තර පාලනයක් පවත්වාගෙන යාමට සමාගමට නොහැකි වූ බව නිරීක්ෂණය විය. | පොළී අනුපාත වැඩිවීමත් සමඟ රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කිරීමට පාරිභෝගිකයන්ගේ උනන්දුව ද වැඩි විය. එබැවින්, NSB ශාඛාවල ගනුදෙනුකරුවන් සංඛ්‍යාවක් ආයෝජනවල නිරත වූ අතර, ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගම වෙත නොපැමිණ ශාඛා හරහා අරමුදල් සහ අයදුම්පත් යවන ලදී. 2022 අප්‍රේල් මාසයේ සිට පාරිභෝගික ආයෝජනවල වැඩ ප්‍රමාණය කළමනාකරණය කිරීම අපහසු විය. ප්‍රධාන කාර්යාල ශාඛාව විසින් තොග වශයෙන් අරමුදල් මාරු කර ඇති අතර ඒවා සැසඳීමට නොහැකි විය.<br><br>කෙසේ වුවද, ශේෂ මාරු අරමුදල් තහවුරු කිරීමට ප්‍රධාන කාර්යාල ශාඛාවට බොහෝ කාලයක් ගත වී ඇත. පාරිභෝගික අරමුදල් ලැබීම් නිසි පරිදි අධීක්ෂණය කරමින් පවතින අතර වර්තමානයේ ඒවා දෛනිකව සැසඳීම සිදු කෙරේ. | අරමුදල් කළමනාකරණය සඳහා සමාගම නිසි අභ්‍යන්තර පාලනයක් පවත්වාගෙන යා යුතු අතර ව්‍යාපාර මෙහෙයුම් කටයුතුවලදී අනපේක්ෂිත තත්ත්වයන්ට මුහුණ දීම සඳහා අවදානම් කළමනාකරණ රාමුව යටතේ කටයුතු කළ යුතුය. |

### 3.3 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන කටයුතුවල සිදු වූ ප්‍රමාද

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නව භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහා සමාගම ඉන්දියානු සමාගමක් (ඉන්දියාවේ ක්‍රෙඩන්ස් ඇනලිටික්ස් සමාගම) සමඟ ගිවිසුමකට එළඹී තිබුණි. 2022 දෙසැම්බර් 31 හෝ ඊට පෙර පද්ධතිය භාර දීමට සමාගම එකඟ වුවද, නියමිත දිනට පෙර පද්ධතිය භාර දීමට සමාගමට නොහැකි විය. | ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගම විසින් 2022.09.30 වන විට දත්ත සංක්‍රමණය කර ඇති අතර වර්තමානයේ සමාගමේ කාර්ය මණ්ඩලය විසින් ගනුදෙනු පද්ධතියට ඇතුළු කරනු ලබන අතර තවදුරටත් වර්ධනයන් අවශ්‍ය ගැටළු සහ ක්ෂේත්‍ර හඳුනා ගනිමින් සිටී. ක්‍රෙඩන්ස් කණ්ඩායම ද පද්ධතිය සංවර්ධනය කිරීමේ ක්‍රියාවලියේ නිරතව සිටී. කෙසේ වුවද, "ක්‍රියාත්මක කිරීමට" පෙර ඉවත් කිරීම අත්‍යවශ්‍ය වන කරුණු කිහිපයක් තිබේ. | සමාගම විසින් අනවශ්‍ය ප්‍රමාදයන් මඟහරවා ගනිමින් නව භාණ්ඩාගාර කළමනාකරණ ක්‍රමය ඵලදායී ලෙස ක්‍රියාත්මක කළ යුතුය. |

### 3.4 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| අ. | සමාගමේ මානව සම්පත් කළමනාකරණ කාර්යයන් ඉටු කිරීම සඳහා නම් කරන ලද නිලධාරියෙකු නොමැත. | ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගම විසින් 2023.05.15 දින සිට ක්‍රියාත්මක වන පරිදි NSB හි ප්‍රධාන කළමනාකරුවෙකු ද්විතීයන පදනම මත පත් කර ඇති අතර ඔහු විසින් සමාගමේ මානව සම්පත් කාර්යය පාලනය කරනු ඇත. | සමාගම මානව සම්පත් කාර්යයන් සඳහා නිලධාරියෙකු බඳවා ගැනීම හෝ වෙන් කිරීම කළ යුතුය. |
| ආ. | සේවක තනතුරු, වගකීම්, අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම්, වෙනත් සුදුසුකම් සහ පළපුරුද්ද, බඳවා ගැනීමේ ක්‍රම සහ උසස්වීම් ආදිය ඇතුළත් කරන ලද සේවකයින් සඳහා බඳවා ගැනීමේ පටිපාටියක් (SOR) සමාගම සතුව නොමැත. | ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගම විසින් බඳවා ගැනිමේ පටිපාටියක් (SOR) පිළියෙළ කර ඇති අතර, මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම සඳහා එය මේ වන විට ඉදිරිපත් කර ඇත. | සේවකයින් සඳහා අනුමත බඳවා ගැනීමේ ක්‍රමයක් (SOR) සමාගම සතුව පැවතිය යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| අ. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව, 2019 වර්ෂයේදී පාරිභෝගික පහසුව සඳහා ජංගම යෙදුමක් හඳුන්වා දීමට සමාගම විසින් සැලසුම් පිළියෙළ කර තිබුණද, විගණන දිනය වූ 2023 මාර්තු 31 දක්වා එය ඵලදායක ලෙස මෙහෙයවීමට සමාගමට නොහැකි විය. | වසර තුනක් සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙළ කළ යුතු වුවද, සමාගම වාර්ෂිකව එය පිළියෙළ කරයි. ඒ අනුව, විගණන සමාලෝචනය සඳහා නවතම ක්‍රියාකාරී සැලැස්ම 2022 වේ. අප විසින් එය 2022 ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොමැත. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සාක්ෂාත් කරගත හැකි ඉලක්ක සහිතව දූරදර්ශී ලෙස සකස් කළ යුතුය. |
| ආ. | 2020 වර්ෂයේදී පර්යේෂණ හා සංවර්ධන ඒකකයක් ස්ථාපනය කිරිමට සැලසුම් කර තිබුණද, විගණන දිනය වූ 2023 මාර්තු 31 දින දක්වාම එම ඒකකය ස්ථාපනය කිරීමට සමාගමට නොහැකි විය. | ක්‍රියාකාරී සැලැස්ම වසර තුනක් සඳහා පිළියෙළ කළද, සමාගම එය වාර්ෂිකව පිළියෙළ කරයි. ඒ අනුව විගණන සමාලෝචනය සඳහා පවතින නවතම ක්‍රියාකාරී සැලැස්ම 2022 වර්ෂයේ සැලැස්ම වේ. එය අප විසින් 2022 ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොමැත. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සාක්ෂාත් කරගත හැකි ඉලක්ක සහිතව විචක්ෂණශීලි ලෙස පිළියෙළ කළ යුතුය. |

### 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගමේ අභ්‍යන්තර විගණන කාර්යය රු. 1,815,397 ක මාසික ගාස්තුවකට පුද්ගලික විගණන ආයතනයකට පවරා ඇති අතර එම විගණන ආයතනය 2022 ජූනි 30 දක්වා කාර්තුමය වාර්තා ඉදිරිපත් කිරීමට සහ ඉන් පසුව, මාසික විගණන වාර්තා ඉදිරිපත් කිරීමට එකඟ වි තිබුණි. කෙසේ වුවද, 2022 වර්ෂය සඳහා සහ විගණන දිනය වූ 2023 මාර්තු 31 දින දක්වා කිසිදු අවසන් අභ්‍යන්තර විගණන වාර්තාවක් නිකුත් කර නොතිබුණි. එබැවින්, අභ්‍යන්තර පාලන දූර්වලතා නියමිත වේලාවට හඳුනා ගැනීමට සමාගමට නොහැකි වූ බව නිරීක්ෂණය විය. අභ්‍යන්තර විගණන කාර්යයේ ඵලදායීතාව සැක සහිත වේ. | 2022 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනය 2022 ඔක්තෝබර් දක්වා අවසන් කර ඇති අතර 2023 ජනවාරි, පෙබරවාරි සහ මාර්තු මාස සඳහාද අභ්‍යන්තර විගණනය සම්පූර්ණ කර ඇත. | සමාගමේ අභ්‍යන්තර පාලන අඩුපාඩු මඟහරවා ගැනීම සඳහා අභ්‍යන්තර විගණනයේ සුමට ක්‍රියාකාරිත්වය සහතික කළ යුතු බව නිර්දේශ කෙරේ. |

## 4.3 විගණන කමිටුව

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අදාළ විගණන කමිටු ප්‍රඥප්තියට අනුව යම් වර්ෂයක් සඳහා අවම වශයෙන් මණ්ඩල විගණන කමිටු රැස්වීම් 04 ක් පැවැත්වීම අවශ්‍ය වුවද, 2022 වර්ෂය සඳහා පවත්වා ඇත්තේ රැස්වීම් 02ක් පමණි. | විගණන වාර්තා ලැබීම ප්‍රමාද වීම මේ සඳහා හේතු වූ අතර මණ්ඩල විගණන කමිටු සඳහා ඉදිරිපත් කිරීමට වාර්තා නොමැති විය. | විගණන කමිටු ප්‍රඥප්තියේ දක්වා ඇති කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා මණ්ඩල විගණන කමිටුව මගින් අවශ්‍ය පරිදි රැස්වීම් පැවැත්විය යුතුය. |